# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2252/23 - 2021 නොවැම්බර් මස 02 වැනි අඟහරුවාදා - 2021.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ වැලිගම නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන වැලිගම නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ(1)(අ) වගන්තිය යටතේ වැලිගම නගර සභාවේ අංක 02 අලුත්වීදිය කොට්ඨාසයට තේරී පත්වූ මොහම්මද් ලfපීර් මුහම්මද් සියාම් අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයකු, සභිකයකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම වවැලිගම නගර සභාවේ අංක 02 අලුත්වීදිය කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සන්දරා දුරගේ ක්‍රිෂාන් ලසන්තක ජයසූරිය ප්‍රනාන්දු නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

වැලිගම නගර සභාවේ තේරීම්භාර නිලධාරි, තානන්තිරි විතානගේ පෝෂිතා කෞමදී වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් සන්දරා දුරගේ ක්‍රිෂාන් ලසන්තක ජයසූරිය ප්‍රනාන්දු, වැලිගම නගර සභාවේ අංක 02 අලුත්වීදිය කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

ටී. ඩබ්ලිව්. පෝෂිතා කෞමදී,
තේරීම්භාර නිලධාරි,
වැලිගම නගර සභාව.

2021 නොවැම්බර් මස 02 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මාතර.

11 - 365


1A - G 35266 — 30 (2021/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන කරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ(1)(අ) වගන්තිය යටතේ කරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ අංක 03 - වළන්තලෙයි කොට්ඨාසයට තේරී පත්වූ විජයදර්මා කේතිස්වරතාස් අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ අංක 03 - වළන්තලෙයි කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා කයිලායපිල්ලෙයි නාගරාසා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, රාජේන්ද්‍රම් ක්‍රිස්ටි අමල්රාජ් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් කයිලායපිල්ලෙයි නාගරාසා, කරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ අංක 03 - වළන්තලෙයි කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

ආර්. සී. අමල්රාජ්,
තේරීම්භාර නිලධාරි,
කරෙයිනගර් ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 02 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
යාපනය.

11 - 366

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.